# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1723/18 – 2011 සැප්තැම්බර් 13 වැනි අඟහරුවාදා – 2011.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන ඉඩමේ පරවශතාව, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාවය අත් කර ගනු ලබන්නේ කවර ඉඩමකින් ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. බලංගොඩ ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ, ජල නල එලීම සඳහා ඉඩමේ පරවශතාවය අත්කර ගැනීම.

2. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද කෝරලේ සුළු කොට්ඨාසයේ, උඩුමුල්ල (අ.ග.පි. 472) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක R/BLN/2006/803 සහ 2009.01.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0190ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලි 3ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – සමරප්පුලිගේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0098ක් පමණ**

උතුරට: ඩී. එම්. ජේ. දඹේවෙල සහ තවත් අය විසින් හිමිකම් කියන සමරප්පුලිගේ කුඹුර සහ උඩ අරාවේ ඇළ; නැගෙනහිරට: එම්. ඩී. ජේම්ස් සහ තවත් අය විසින් හිමිකම් කියන මෙම කුඹුරේ ඉතිරි කොටස; දකුණට: එම්. ඩී. ජේම්ස් සහ තවත් අය විසින් හිමිකම් කියන මෙම කුඹුරේ ඉතිරි කොටස සහ ඇළ; බටහිරට: ඩී. එම්. ජේ. දඹේවෙල සහ තවත් අය විසින් හිමිකම් කියන සමරප්පුලිගේ කුඹුර.

02. **කැබලි අක්ෂර 'බී' – සමරප්පුලිගේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0074ක් පමණ**

උතුරට: ඩී. එම්. ජේ. දඹේවෙල සහ තවත් අය විසින් හිමිකම් කියන සමරප්පුලිගේ කුඹුර සහ ඇළ; නැගෙනහිරට: එන්. ඩී. සුනිල් ආනන්ද සහ තවත් අය විසින් හිමිකම් කියන මෙම කුඹුරේ ඉතිරි කොටස; දකුණට: එන්. ඩී. සුනිල් ආනන්ද සහ තවත් අය විසින් හිමිකම් කියන මෙම කුඹුරේ ඉතිරි කොටස සහ ඇළ; බටහිරට: ඇළ සහ ඩී. එම්. ජේ. දඹේවෙල සහ තවත් අය විසින් හිමිකම් කියන සමරප්පුලිගේ කුඹුර.

03. **කැබලි අක්ෂර 'සී' – නුන්ගහකුඹුරේ ගොඩහේන – ප්‍රමාණය: හෙක්. 0.0018ක් පමණ**

උතුරට: කාන්ති මුණසිංහ විසින් හිමිකම් කියන නුන්ගහකුඹුරේ දිඹුලේහේන සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ එදිරිල්ල ආරච්චිගේ දොන් සුනිල් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: එදිරිල්ල ආරච්චිගේ දොන් සුනිල් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ග (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ග (ප්‍රාදේශීය සභා) සහ කාන්ති මුණසිංහ විසින් හිමිකම් කියන නුන්ගහකුඹුරේ දිඹුලේහේන.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2006/WS/391.
2011 ජුලි මස 07 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 1228

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉද්දගොඩපත්තුව සුළු කොට්ඨාසයේ, පැපිලියවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේඒ/ඩීඩීඑන්/06/491 සහ 2006.10.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.154ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබලි 2:

01. **කැබලි අක්ෂර 'ඒ' – පුවක්ගහවෙල – ප්‍රමාණය: හෙක්. 0.095ක් පමණ**

උතුරට: මාර්ගය, අයිතිකරු නොදන්නා පුවක්ගහවෙල හා කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී, එස්. එච්. විද්‍යාසේකර හිමිකම් කියන අලුත්හේන සහ පුවක්ගහවෙල; දකුණට: එස්. එච්. විද්‍යාසේකර හිමිකම් කියන පුවක්ගහවෙල; බටහිරට: මාර්ගය සහ අයිතිකරු නොදන්නා පුවක්ගහවෙල.

02. **කැබලි අක්ෂර 'බී' – අලුත්හේන – ප්‍රමාණය: හෙක්. 0.059ක් පමණ**

උතුරට: අයිතිකරු නොදන්නා පුවක්ගහවෙල සහ එස්. එච්. විද්‍යාසේකර හිමිකම් කියන අලුත්හේන; නැගෙනහිරට: එස්. එච්. විද්‍යාසේකර හිමිකම් කියන අලුත්හේන සහ මු.පි.ක. 3779 හි කැබලි අංක 01; දකුණට: මු.පි.ක. 3779 හි කැබලි අංක 01, එස්. එච්. විද්‍යාසේකර හිමිකම් කියන අලුත්හේන හා කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ සහ අයිතිකරු නොදන්නා පුවක්ගහවෙල.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2006/වීඊටී/125.

2011 ජූලි මස 22 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 1229